(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 60. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 ජුනි 17** අඟහරුවාදා **පූ.භා. 9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **කේ.ඩී. ලාල් කාන්ත මහතා,** කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **විජිත හේරත් මහතා,** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා,** මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පී. රුවන් සෙනරත් මහතා,** පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රොෂාන් අක්මීමන මහතා**

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**

ගරු **ජේ.සී. අලවතුවල මහතා**

ගරු **එම්.කේ.එම්. අස්ලම් මහතා**

ගරු **ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**

ගරු **(ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය**

ගරු **බී. ආරියවංශ මහතා**

ගරු **(වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**

ගරු **කේ. ඉලංකුමාරන් මහතා**

ගරු **අර්කම් ඉල්යාස් මහතා**

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා

ගරු ඔෂානි උමංගා මහත්මිය

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෛචෙල්වි මෙනෙවිය

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු  නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු  රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා

ගරු  නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු  චන්දන තෙන්නකෝන් මහතා

ගරු  චාමර සම්පත් දසනායක මහතා

ගරු  සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු  (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු  තනුර දිසානායක මහතා

ගරු  සුජීව දිසානායක මහතා

ගරු  ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු  (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු  කිංස් නෙල්සන් මහතා

ගරු  නන්දන පත්මකුමාර මහතා

ගරු  අරුණ පනාගොඩ මහතා

ගරු  නිශාන්ත පෙරේරා මහතා

ගරු  අජිත් පී. පෙරේරා මහතා

ගරු  කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු  නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු  ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු  අමිල ප්‍රසාද් මහතා

ගරු  ලාල් ප්‍රේමනාත් මහතා

ගරු  නන්ද බණ්ඩාර මහතා

ගරු  පද්මසිරි බණ්ඩාර මහතා

ගරු  රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු  සුදත් බලගල්ල මහතා

ගරු  (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු  ඊ.එම්. බස්නායක මහතා

ගරු  විජේසිරි බස්නායක මහතා

ගරු  (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු  ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෙෙරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්‍ෂ මහතා

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ආර්.ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ෆස්මින් ෂරීෆ් මහතා

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු අරවින්ද සෙනරත් මහතා**

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, එල්.ඩී.-ඕ 19/2025 දරන 'සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සහ එල්.ඩී.-ඕ 20/2025 දරන 'සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් දෙකක පිටපත්, මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි."

II

"2025.06.06 වැනි සිකුරාදා දින වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නවලට අදාළව පිළිතුරු ලබාදෙන අවස්ථාවේදී අතුරු ප්‍රශ්න ඇසීමේදී මෙම සභාවේදී ඇති වූ තත්ත්වය පිළිබඳව කරුණු පැහැදිලි කිරීමක් කිරීමට කැමැත්තෙමි.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 31 සිට 37 දක්වා වාචික පිළිතුරු අපේක්ෂා කරන සහ වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ආකාරය පිළිබඳව විධිවිධාන සලසා ඇති අතර, ඒ අනුව පොදු කටයුතු පිළිබඳව ප්‍රශ්න අග්‍රාමාත්‍යවරයාගෙන් හෝ ජනාධිපතිවරයා විසින් පවරා දෙන ලද යම් විෂයයන් සහ කාර්යයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයීය වගකීම් ඇති අමාත්‍යවරයකුගෙන් එලෙස ප්‍රශ්න අසනු ලැබිය හැකි ය.

ඒ අනුව, ස්ථාවර නියෝග 33(1) මඟින් සලසා දී ඇති විධිවිධාන ප්‍රකාරව එලෙස ලබාදෙනු ලබන පිළිතුරක් සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්න දෙකකට නොවැඩි සංඛ්‍යාවක් ඇසීමට අවස්ථාව සලසා ඇති නමුත් එම අතුරු ප්‍රශ්න මඟින් මුල් ප්‍රශ්නයේ ඇතුළත් නොවූ කරුණු මතු කරනු නොලැබිය යුතු අතර වාචික පිළිතුරකින් පැන නඟින යම් කරුණක් වඩාත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා පමණක් විමසනු ලැබිය යුතු බව ඉතා පැහැදිලිව සඳහන් කර ඇත.

එසේම, තවදුරටත් කවර හෝ අදාළ ප්‍රශ්නයක් මඟින් ප්‍රශ්න ඇසීමට ඇති ඉඩකඩ පිළිබඳ රීති උල්ලංඝනය වේ යැයි කථානායකවරයාගේ මතය වන්නේ නම්, එම අදාළ ප්‍රශ්න අසනු ලැබීමට කථානායකවරයා විසින් ඉඩ දෙනු නොලැබිය යුතු ය.

තවද, අදාළ ප්‍රශ්න ඇසීමට හා ඒවාට පිළිතුරු දීම සඳහා ලබා දී ඇති කාලය කථානායකවරයා විසින් සීමා කරනු ලැබිය හැකි බවත් ස්ථාවර නියෝග 33(2) හි වැඩිදුරටත් සඳහන්ව ඇති බවත් මෙම සභාවේ අවධානයට යොමු කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව අදාළ ප්‍රශ්න ඇසීම සම්බන්ධයෙන් ඉතා පැහැදිලි සහ නිරවුල් ස්ථාවර නියෝග විධිවිධාන සඳහන්ව තිබියදී 2025.06.06 දින අදාළ ප්‍රශ්න ඇසීමේදී මෙම සභාවේදී ඇති කරන ලද අනවශ්‍ය කලබලකාරී තත්ත්වය සහ ඒ හේතුවෙන් සභාවේ වැඩකටයුතුවලට ඉතා බරපතල ලෙස සිදුවූ බාධාවන් පිළිබඳව මම දැඩි ලෙස කණස්සල්ලට පත් වන අතර ඒ සම්බන්ධයෙන් මාගේ බලවත් අප්‍රසාදය පළ කරමි.

විශේෂයෙන්ම එදින, අභාවප්‍රාප්ත හිටපු ගරු මන්ත්‍රීවරයන් සිව්දෙනෙකුගේ ශෝක ප්‍රකාශ යෝජනා සලකා බැලීමට නියමිතව තිබූ අතර, ඇති වූ මෙම නොසන්සුන්කාරී තත්ත්වය හේතුවෙන් එම අවස්ථාවට සහභාගී වීම පිණිස පාර්ලිමේන්තු ගැලරියට පැමිණ සිටි අදාළ මන්ත්‍රීවරයන්ගේ ආසන්නතම පවුලේ ඥාතීන් මුහුණ දුන් අපහසුතාවයන් පිළිබඳව මාගේ බලවත් කණගාටුව පළ කරමි.

ඒ අනුව, මෙම සියලු තත්ත්වයන් සලකා මින් ඉදිරියට වාචික පිළිතුරු අපේක්ෂාවෙන් අසනු ලබන ප්‍රශ්න සම්බන්ධයෙන් සෑමවිටම මා විසින් ස්ථාවර නියෝගවල සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරනු ලබන අතර අදාළ මන්ත්‍රීවරයන් ද ඊට අනුගතව කටයුතු කරනු ඇතැයි මම උදක්ම බලාපොරොත්තු වන අතර, ඒ අනුව අනවශ්‍ය බාධා කිරීම්වලින් තොරව සභාවේ කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මෙම උත්තරීතර සභාව නියෝජනය කරනු ලබන ඔබ සැමගේ පූර්ණ සහයෝගය මම බලාපොරොත්තු වෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මැයි 19 දිනැති අංක 2437/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි ඉදිරිපත් කර, එම රෙගුලාසි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ලංකා පිඟන් සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) පරිසර අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති, ගරු සුනිල් කුමාර ගමගේ මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අප්‍රේල් 03 දිනැති අංක 2430/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(ii) 2022 වර්ෂය සඳහා ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) අහංගම, තිත්තගල්ල, පැලැස්ස පාර යන ලිපිනයෙහි පදිංචි ඉපලවත්තගේ ගාමිණී මහතාගෙන් ලැබුණු 2025.03.09 දිනැති පෙත්සම ගරු රත්න ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මොරටුව, කටුබැද්ද, ජෝන් රොද්‍රිගෝ මාවත, අංක 57/13 දරන ස්ථානයෙහි පදිංචි ජේ.ඒ.ඊ.අයි. පෙරේරා මහත්මියගෙන් ලැබුණු 2025.03.22 දිනැති පෙත්සම; සහ

(ii) පානදුර, දිබ්බැද්ද, අංක 179/2 දරන ස්ථානයෙහි පදිංචි ටී.එල්.සී. ද සිල්වා මහත්මියගෙන් ලැබුණු 2025.03.17 දිනැති පෙත්සම

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(3) (i) මාලබේ, මිහිඳු මාවත, අංක 33/ඊ/32 දරන ස්ථානයෙහි පදිංචි ජානකී කොබ්බෑකඩුව මහත්මියගෙන් ලැබුණු 2025.03.12 දිනැති පෙත්සම; සහ

(ii) රඹුක්කන, හේවාදිවෙල, මහගම, වාගොල්ල යන ලිපිනයෙහි පදිංචි එස්. දිනෝෂනී දිසානායක මහත්මියගෙන් ලැබුණු 2025.03.10 දිනැති පෙත්සම

ගරු අශෝක ගුණසේන මහතා විසින් පිළිගන්වන ලදී.

(4) තෙල්දෙණිය, පහලගම්මැද්ද, අංක 298/4 දරන ස්ථානයෙහි පදිංචි එන්.වී. සිරිමලී මහත්මියගෙන් ලැබුණු 2025.02.18 දිනැති පෙත්සම ගරු ඊ.එම්. බස්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

(5) බේරුවල, පන්නිල පාර, අංක 102 දරන ස්ථානයෙහි පදිංචි පී. ආර්. ඇන්ටනී ජූලියන් ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු 2024.12.20 දිනැති පෙත්සම ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; (44 වන අධිකාරය වූ) තුරඟ තරග මත ඔට්ටු ඇල්ලීමේ ආඥාපනත, (46 වන අධිකාරය වූ) සූදු ආඥාපනත සහ 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත ඉවත් කිරීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2025 ජූලි 08 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6. විනිමය පත්‍ර (සංශෝධන):** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත, — (82 වන අධිකාරය වූ) විනිමය පත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2025 ජූලි 08 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**7. සමෘද්ධි (සංශෝධන):** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 2013 අංක 1 දරන සමෘද්ධි පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2025 ජූලි 08 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**8. ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග:** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අප්‍රේල් 03 දිනැති අංක 2430/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.06.03 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(පූ.භා. 11.03 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(පූ.භා. 11.27 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි විදේශ කටයුතු සහ විදේශ රැකියා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.50 ට ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 3.30 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 3.52 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. කල් තැබීම:** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි විදේශ කටයුතු සහ විදේශ රැකියා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 4.51 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය විසින්, පාර්ලිමේන්තුව 2025 ජූනි 18 බදාදා පූ. භා. 9.30 වනතෙක් කල් තබන ලදී.